# පොලිස් මාධ්‍ය කොට්ඨාසය
## பொலிஸ் ஊடகப் பிரிவு
## POLICE MEDIA DIVISION
සුහුරුපාය, බත්තරමුල්ල

තැ.පෙ.අංකය
த. பெ.இ
2171635
Po.Box No
10120

ෆැක්ස්
தொலைநகல
Fax
011-

දුරකථන
தொலைபேசி
Telephone
011-2887973
(HUNTING)

වෙබ්.ලිපිනය
இணையதளம்
Web Site
www.Police.lk

ඊ මේල්
மின்னஞ்சல்
E-mail
dir.media@police.gov.lk


---

මගේ අංකය
எனது இலக்கம்
My NO
1574/2024

ඔබේ අංකය
உமது இலக்கம்
Your No
/ 2024

දිනය
திக
Date
13/10/2024
පැය 0530

## මාධ්‍ය නිවේදනය

**01. හෙරොයින් සමඟ සැකකරුවෙකු අත්අඩංගුවට - ගල්කිස්ස කොට්ඨාස අපරාධ විමර්ශන කාර්යංශය.**

2024.10.12 වන දින සවස් කාලයේදී ගල්කිස්ස පොලිස් වසමේ ගල්කිස්ස දුම්රිය ස්ථානය අසලදී ගල්කිස්ස කොට්ඨාස අපරාධ විමර්ශන කාර්යංශයේ නිලධාරීන් විසින් ලද තොරතුරක් මත වැටලීමක් සිදුකර **හෙරොයින් ග්‍රෑම් 05 මිලිග්‍රෑම් 200 ක් සන්තකයේ තබාගෙන සිටි සැකකරුවෙකු** අත්අඩංගුවට ගෙන ගල්කිස්ස පොලිස් ස්ථානය වෙත ඉදිරිපත් කර ඇත.

**අත්අඩංගුවට ගත් සැකකරු වයස අවුරුදු 42 ක් වන වැල්ලවත්ත ප්‍රදේශයේ පදිංචිකරුවෙකි.**

ගල්කිස්ස පොලිසිය වැඩිදුර විමර්ශන සිදු කරනු ලබයි.

**02. මත්කරල් සමඟ සැකකරුවෙකු අත්අඩංගුවට - ගල්කිස්ස කොට්ඨාස අපරාධ විමර්ශන කාර්යංශය.**

2024.10.12 වන දින රාත්‍රී කාලයේදී ගල්කිස්ස පොලිස් වසමේ ඕඩියන් හන්දියේදී ගල්කිස්ස කොට්ඨාස අපරාධ විමර්ශන කාර්යංශයේ නිලධාරීන් විසින් ලද තොරතුරක් මත වැටලීමක් සිදුකර **මත් කරල් 1000 ක් සන්තකයේ තබාගෙන සිටි සැකකරුවෙකු** අත්අඩංගුවට ගෙන ගල්කිස්ස පොලිස් ස්ථානය වෙත ඉදිරිපත් කර ඇත.

**අත්අඩංගුවට ගත් සැකකරු වයස අවුරුදු 32 ක් වන දෙහිවල ප්‍රදේශයේ පදිංචිකරුවෙකි.**

ගල්කිස්ස පොලිසිය වැඩිදුර විමර්ශන සිදු කරනු ලබයි.

**03. දුම්රියේ ගැටී පුද්ගලයන් දෙදෙනෙකු සහ කුඩා ළමයෙකු මියයාමක් - කළුතර දකුණ පොලිස් වසම.**

2024.10.12 වන දින රාත්‍රී කාලයේ කළුතර දකුණ පොලිස් වසමේ කටුකුරුන්ද දුම්රිය ස්ථානයේ පදික වේදිකාවේ සිටි පිරිමි පුද්ගලයන් දෙදෙනෙකු සහ කුඩා පිරිමි දරුවෙකු බෙලිඅත්ත සිට මරදාන බලා ධාවනය වූ සීඝ්‍රගාමී දුම්රියේ ගැටී පිරිමි පුද්ගලයන් දෙදෙනා එම ස්ථානයේදීම මියගොස් ඇති අතර, කුඩා දරුවා තුවාල ලබා කළුතර නාගොඩ රෝහලට ඇතුලත් කිරීමේදී මියගොස් ඇත.

**මරණකරුවන් අවුරුදු 02, 21 හා 47 වයස්වල පසු වූ කළුතර දකුණ ප්‍රදේශයේ පදිංචිකරුවන් වේ.**

මෘත ශරීර කළුතර දකුණ රෝහලේ මෘත ශරීරාගාරයේ තැන්පත් කර ඇත. මරණකරුවන් අතර අවුරුදු 02 ක කුඩා දරුවාගේ පියාද සිටින අතර, ඔහු වයස අවුරුදු 21 ක් වන පුද්ගලයා වේ. කළුතර දකුණ පොලිසිය වැඩිදුර විමර්ශන සිදු කරනු ලබයි.

**04. මාරක රිය අනතුරක් - නෙල්ලිඅඩි පොලිස් වසම.**

2024.10.12 වන දින උදෑසන කාලයේ නෙල්ලිඅඩි පොලිස් වසමේ යාපනය පේදුරුතුඩුව මාර්ගයේ වල්ලායි පාලම ආසන්නයේදී යාපනය දෙස සිට පේදුරුතුඩුව දෙසට ධාවනය වූ කුඩා ලොරි රථයක් ඉදිරියෙන් පැමිණි යතුරු පැදියක මුහුණට මුහුණ ගැටී අනතුරක් සිදුව ඇත. අනතුරින් බරපතල තුවාල ලැබූ යතුරු පැදිකරු මන්දිගායි රෝහලට ඇතුලත් කිරීමෙන් අනතුරුව මියගොස් ඇත.

**මරණකරු වයස අවුරුදු 38 ක් වූ පුලෝලි දකුණ, පුලෝලි ප්‍රදේශයේ පදිංචිකරුවෙකි.**

මෘත ශරීරය මන්දිගායි රෝහලේ මෘත ශරීරාගාරයේ තැන්පත් කර ඇත. අනතුර සම්බන්ධයෙන් ලොරි රථ රියදුරු අත්අඩංගුවට ගෙන ඇත. නෙල්ලිඅඩි පොලිසිය වැඩිදුර විමර්ශන සිදු කරනු ලබයි.

**05. මාරක රිය අනතුරක් - කිරිඳිවැල පොලිස් වසම.**

2024.10.12 වන දින උදෑසන කාලයේ කිරිඳිවැල පොලිස් වසමේ පැපිලියවල රදාවාන මාර්ගයේ නැඳුන්ගොල්ල ප්‍රදේශයේදී රදාවාන දෙස සිට පැපිලියවල දෙසට ධාවනය වූ යතුරු පැදියක් පැදිකරුට පාලනය කර ගත නොහැකිව මාර්ගයේ පෙරළී ඉදිරියට ඇදී ගොස් ඉදිරියෙන් පැමිණි යුධ හමුදා ලොරි රථයක ගැටී අනතුරක් සිදුව ඇත. අනතුරින් බරපතල තුවාල ලැබූ යතුරු පැදිකරු රදාවාන රෝහලට ඇතුලත් කිරීමෙන් අනතුරුව මියගොස් ඇත.

**මරණකරු වයස අවුරුදු 30 ක් වූ නැඳුන්ගොල්ල, මන්ඩාවල ප්‍රදේශයේ පදිංචිකරුවෙකි.**

මෘත ශරීරය රදාවාන රෝහලේ මෘත ශරීරාගාරයේ තැන්පත් කර ඇත. අනතුර සම්බන්ධයෙන් යුධ හමුදා ලොරි රථ රියදුරු අත්අඩංගුවට ගෙන ඇත. කිරිඳිවැල පොලිසිය වැඩිදුර විමර්ශන සිදු කරනු ලබයි.

## 06. හදිසි ගින්නක් - උයිලංකුලම පොලිස් වසම.

2024.10.12 වන දින දහවල් කාලයේ උයිලංකුලම පොලිස් වසමේ තිරුකේදීෂ්වරම් ප්‍රදේශයේ පිහිටා ඇති ළමා නිවාසයක ගබඩාවේ හදිසි ගින්නක් හට ගෙන ඇති බවට උයිලංකුලම පොලිසියට ලද පණිවිඩයක් අනුව වහාම ක්‍රියාත්මක වූ පොලිස් නිලධාරීන් සහ ප්‍රදේශවාසීන් එක්ව ගින්න මැඩ පවත්වා ඇත.

ගින්න හේතුවෙන් ජීවිත හානි සිදුව නොමැති අතර, සිදුවූ දේපල හානිය මෙතෙක් තක්සේරු කර නොමැත. විදුලි කාන්දුවක් හේතුවෙන් මෙම ගින්න හට ගෙන ඇති බවට පොලිසිය සැකකරනු ලබයි. උයිලංකුලම පොලිසිය වැඩිදුර විමර්ශන සිදු කරනු ලබයි.

**පොලිස් මාධ්‍ය කොට්ඨාසය.**